Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 3 (1 වාරය)

විෂය:- :- ගණිතය

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 3 මිනිත්තු 20 )

# පරිමිතිය

## 2.1 පරිමිතිය යනු කුමක්ද?

- සංවෘත සරල රේඛීය තලරූපයක පැති සියල්ලේ දිග ප්‍රමාණවල එකතුව, එහි පරිමිතිය ලෙස හැඳින්වේ.
- සමචතුරස්‍රය, සෘජුකෝණාස්‍රය, ත්‍රිකෝණය යන තලරූප වල පරිමිතිය ලබා ගන්නා ආකාරය සිහිපත් කර ගනිමු.
  - පාදයක දිග ඒකක $l$ වූ සමචතුරස්‍රයක පරිමිතිය ඒකක $p$ නම්,




$p = l + l + l + l$
$p = 4l$

  - දිග ඒකක $x$ ද පළල ඒකක $y$ ද වූ සෘජුකෝණාස්‍රයක පරිමිතිය ඒකක $p$ නම්,




$p = x + y + x + y$
$p = 2x + 2y$

  - පාදයක දිග ඒකක $a$ වූ සමපාද ත්‍රිකෝණයක පරිමිතිය ඒකක $p$ නම්,




$p = a + a + a$
$p = 3a$

  - එක් එක් පාදයක දිග ඒකක $a$, $b$ සහ $c$ වූ ත්‍රිකෝණයක පරිමිතිය ඒකක $p$ නම්,




$p = a + b + c$

- පෙළ පොතේ පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

2.2 සංයුක්ත සරල රේඛීය තල රූපයක පරිමිතිය

- තල රූප කිහිපයක් එකතු කිරීමෙන් සාදා ගන්නා ලද තල රූපයක් සංයුක්ත තල රූපයක් ලෙස හැඳින්වේ.
- සංයුක්ත තල රූපයක පරිමිතිය, එම රූපයේ පූර් ණ වටයක ඇති සියලුම සරල රේඛා ඛණ්ඩවල දිග ප්‍රමාණ එකතු කිරීමෙන් ලබා ගත හැකිය.




රූපයේ පරිමිතිය $= 2\ \text{cm} + 3\ \text{cm} + 5\ \text{cm} + 2\ \text{cm} + 5\ \text{cm} + 2\ \text{cm} + 5\ \text{cm}$
$= 24\ \text{cm}$

- සංයුක්ත තල රූපයක් සෑදී ඇති එක් එක් තල රූප වල පරිමිතිය වෙන වෙනම සොයා එකතු කිරීමෙන් සංයුක්ත තල රූපයේ පරිමිතිය ලබා ගත **නොහැකිය**.
- පෙළ පොතේ 2.1 අභ්‍යාසය කරන්න.